# භාරතීය දේව විශ්වාස ලාංකේය පුරාකතා සාහිත්‍යයට බලපා ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

*කුමාරි, ජී. දම්මිකා [1] සහ දිල්හානි, එච්- පී- [2]*

විවිධ කර්මාන්ත ජන ඇදහීම්, පළාත්බද විශ්වාස, ඇවතුම්-පැවතුම් ආදි වූ විවිධ ක්ෂේත්‍ර පුරා විසිරී පවතින පුරාකතා සාහිත්‍යයක් පවතී. පුරාකතා යනු ප්‍රබන්ධ කතා විශේෂයකි. ලාංකේය ශාන්තිකර්ම හා බැඳී පවතින පුරාවෘත්ත, පුරාකතා බොහොමයක්ම නිර්මාණය කිරීමේදී භාරතීය දේව විශ්වාසයන්හි ආභාසය ලබා ඇති බව හඳුනාගත හැකිය. මෙම පර්යේෂණයේදී පුරාකතා කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරමින් ලාංකේය පුරාකතා සාහිත්‍යයට භාරතීය දේව විශ්වාසයන්හි ආභාසය ලැබී ඇත්තේ කවරාකාරයෙන්ද යන්න අධ්‍යයනයට ලක් කරන අතර, පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සාහිත්‍යමය මූලාශ්‍රය භාවිත කෙරේ. ඒ අනුව යක් තොවිල්වලදී පූජාවට ලක් කෙරෙන පොල් හෙවත් තැඹිලි උපත, මහසොන් උත්පත්ති කතාව ආදි පුරාකතාවන්හි මේ භාරතීය දේව සංකල්පයන්හි ආභාසය ලබා ඇති බැව් දෘශ්‍යමාන සාධක වේ. භාරතීය හින්දු දේව ඇදහීම මුල් කරගත් ඊශ්වර, උමා සම්බන්ධ කර ගනිමින් මේ කතා නිර්මාණය වී ඇති අතර, භාරතයේ අතිශයින් ප්‍රචලිත දේව කතාන්දරයක් වූ ස්කන්ධ පුරාණය හා මෙහි සඳහන් කරුණු සම්බන්ධ වී ඇති බැව් හඳුනාගත හැකිය. එසේම පත්තිනි දේව පුරාවෘත්තයද විශේෂත්වයක් ගන්නා අතර, පත්තිනි දේවතාවිය දේව යාගයන්හි පුද ලබන එකම කාන්තා දේවතාවිය වෙයි. භාරතීය දේව සංකල්පයන්හි ආභාසය පෙන්නුම් කරන මෙම විශ්වාසයන් සිංහල ජන සමාජය හා බෙහෙවින් බද්ධ වී ඇත. එහිදී භාරතීය ආභාසය ලැබුණද ලාංකේය සමාජයකට අනුරූපව එම පුරාකතා ගොඩනැගී ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ භාරතීය දේව විශ්වාස, පුරාකතා, ශාන්තිකර්ම

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*gdkumari.gamage@gmail.com*
[2]*ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*dilhanishashika1992@gmail.com*